**ප්‍රශ්නය : ස්වාමීන් වහන්ස අද සමාජයට ප්‍රශ්න රාශියකට, මුහුණ දෙන්න සිදු වෙලා. අපරාධ රැල්ලක් සමාජය පුරා පැතිරිලා තිබෙනවා. සමාජය තුළ විවිධ බේදීම් තියෙනවා. බෞද්ධ සමාජයක් වශයෙන් මේ ප්‍රශ්න වලට අපි මුහුණ දෙන්නේ කොහොමද?**

පිළිතුර : ඉතා වැදගත් ප්‍රශ්නයක්. ඔය කාරණය අද රටේ ලොකු - කුඩා, උගත් - නූගත්, නාගරික - ගම්බද සෑම ජන කොටසක් තුළම රැව් පිළිරැව් දෙන ප්‍රශ්නයක් බවට පත් වෙලා. ලෝකයේ අපරාධ හැමදාම තිබුණා. අපරාධ නැති කාලයක් නැහැ. පංච ශීලයෙන් කියන්නේ වැරදි පහක් ගැන. ඒ වැරදි පහෙන් වැලකෙන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන්නේ ඒ වැරදි එදා තිබුණ නිසා. නමුත් අද තියෙන ප්‍රශ්නය, ඒවා ප්‍රමාණයට වඩා වැඩිවෙලා තියෙනවා. ඉස්සර අපි දන්නවා මත් පැන් ගැන කතා කලොත්, කෙනෙක් ගමක මත්පැන් ටිකක් පානය කරන්නේ බොහෝම කලාතුරකින්. බොහෝම හැංගි හොරා, බොහෝම ලජ්ජයි, බයයි. නමුත් අද ප්‍රසිද්ධියේ උත්සවශ්‍රීයෙන් කරන ප්‍රධාන පෙළේ පානයක් තත්ත්වයකට ඇවිත් තියෙනවා. ඔය නිසා මේ අපරාධ වලට යම් කිසි බලයක් ලැබිලා තියෙනවා. පාපයට තියෙන බය නැති වෙලා. පාපයට තියෙන ලජ්ජාව නැති වෙලා. අද රටේ මිනිස්සු හැම අංශයකින්ම බොහෝම අසංවරශීලි තත්ත්වයකට පත් වෙලා. පාරේ යන මනුස්සයාත් අසංවරයි. වාහනයක යන කෙනාත් අසංවරයි. රිය අනතරු ගැන බලමු. බස් එකේ යන මිනිස්සු රියදුරු මහත්තයා පුළුවන් තරම් වේගයෙන් රිය පදවනවාට බොහෝම කැමතියි. හැප්පුනායින් පස්සේ ඒ ඔක්කෝම එක පැත්තක් වෙනවා. අර රියදුරා තනි වෙනවා. ඒ නිසා මානසික වෙනසක්, විපර්යාසයක් වහාම රටේ ඇති කරන්න වෙලා.

අපි කුඩා කාලයේ පාසල් පාඩම් පොතේ තිබුණ දෙයක් තමයි පාරේ කෙසෙල් ලෙල්ලක් දාන්න එපා. අඹ ලෙල්ලක් දාන්න එපා. එවායින් ලිස්සලා වැටෙනවා කියලා. වීදුරු කැල්ලක්වත් දාන්නේ නැහැ. අපි මහණ වුන කාලයේ ගල්කිස්සේ මහ මග යන සමහර අය පාරේ අයිනේ තිබුණ ගල් කැට වගේ දේ අයින් කරගෙන යනවා. එවැනි සදාචාරාත්මක ගුණාංග අද නැති වෙලා. මේ අපරාධ රැල්ලට ප්‍රධාන මාර්ගය ඒ නැති වීම තමයි.

**ප්‍රශ්නය : මහා සංඝරත්නයේ විවිධ පාර්ශවය මේ සදාචාරාත්මක පිරිහීම ගැන කිසියම් අදහස් හුවමාරුවක් කරලා එකඟතාවයකට ඇවිත් තිබෙනවාද කරන්න පුළුවන් කුමක් ද කියලා?**

පිළිතුර : ඉංග්‍රීසි, පෘතුග්‍රීසි හා ලන්දේසි කාලයන්හි සිදුවූ විපත්ති නිසාත්, දකුණු ඉන්දීය බලපෑම් රාජ්‍ය මට්ටමට ඒමෙන් ඇති වූ විපර්යාස නිසාත් සංඝ ශාසනය

පිරිහුනා. වැලිවිට අසරණ සරණ සරණංකර සඟරාජයානන් වහන්සේ නැවත එක්දහස් හත්සිය ගණන් වල දී සාසනය මේ තත්ත්වයෙන් ගොඩ ගත්තා. උන්වහන්සේ උපසම්පදා වෙන විටත් වයස අවුරුදු පනස් පහක්. අයෝධ්‍යා නුවරින් උපාලි මහ තෙරුන් වහන්සේ ප්‍රධාන මහා සංඝයා වැඩම කර මෙරට උපසම්පදාව ඇති කළා. ඉන් පසුව පහත රට ප්‍රදේශ වල වෙනසක් ඇති වුණා. බෝධි සත්ව ගුණයෙන් ආරම්භ කළ ඒ සත් ව්‍යාපාරයට විවිධ බලපෑම් නිසා ඇති වූ කෙනෙහෙලිකම් මත පහතරටත් උපසම්පදාව තිබිය යුතුයි කියන හැඟීමක් ඇති කළා. අනතුරුව අමරපුරත් ඉන්පසු කාලයක රාමඤ්ඤ මහා නිකායත් ඇති වුණා. මේ අමරපුර මහා නිකායත්, රාමඤ්ඤ මහා නිකායත් බිහි වීම පිළිබඳවයි. ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් කියන්න තියෙන්නේ ඒ ආරම්භක කාලයේ යම් යම් බෙදීම් තිබුණාට දැන් සංඝයා වහන්සේලා අතර කිසිම කරුණක් ගැන කිසිම වාද භේදයක් නැහැ.

විදේශීය රට වල මේ තුන් නිකායේ උපසම්පදා කටයුතු කෙරෙන්නේත් එකට. ඉනාමළුවේ සුමංගල මහා නායක හිමියන්ගේ මූලිකත්වයෙන් සියළු පාර්ශව එකට උපසම්පදා කිරීමේ සැලසුමක් දඹුලු විහාරයේ පිළියෙල කරලා තියෙනවා. ඒ නිසා පරණ වාද භේද ප්‍රශ්න කිසිවක් නැහැ. අපි ඔක්කෝම එකට කටයුතු කරන්නේ. අපි සාකච්ඡා කරනවා. සාකච්ඡා කරලා ඒකීය තීන්දු ගන්න පුළුවන් තත්ත්වයට අද මහා සංඝයා වහන්සේ දියුණු වෙලා. අතරින් පතර ප්‍රශ්න තියෙනවා. ඒක කවදාවත් නැති කරන්න බැහැ. අපි සාකච්ඡා කරලා මේ අපරාධ රැල්ල මැඩ පවත්වා ගෙන භික්ෂූන් වහන්සේලා වශයෙන් ඉදිරියට යා යුතු අකාරය ගැන අපි නිතර කතා බස් කරනවා. වැඩත් කරනවා.

**ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, කොහොමද ඒක කරන්නේ කියලා තව ටිකක් පැහැදිලි කරන්න පුළුවන්ද?**

පිළිතුර : ඒ කාරණය ගැන කතා කරන විට අකමැත්තෙන් වුණත් කිව යුතු කරුණ අපේ ජනමාධ්‍ය මේ අපරාධ රැල්ලට අනුබල දෙනවා කියන එක. ගුවන් විදුලි නාලිකා ගණනාවක් තියෙනවා. රූපවාහිනි තියෙනවා. ඒවායේ කතා කරන භාෂාව ගැන බැලුවොත් එහෙම ඒ සිංහල නෙමෙයි. සිංහල භාෂාවට ප්‍රතිවිරුද්ධ ඉතාමත් අශ්ශීල පසුකාලයේ එකතු වුණ කැත වචන වැදගත් සාකච්ඡා වලදී පවා භාවිතා කරනවා. කිසිම පරිපාලනයක් නැහැ. ප්‍රවෘත්ති පත්‍රවල මුල් තැනක් දෙන්නේ අපරාධ වලට. අපේ රටේ විතරක් නෙමෙයි දියුණු රටවල් වලත් බැලුවත් ජනමාධ්‍ය මේ අපරාධ රැල්ලට අනියම් වශයෙන් අනුබල දෙනවා. එය නවත්වා ගැනීමට රාජ්‍ය මට්ටමින් පියවරක් ගෙන දැනුවත් කළ යුතුව තිබෙනවා.

**ප්‍රශ්නය : සමහරු කියනවා ඒ අභියෝග මතු වෙන්න විවෘත ආර්ථිකයත් එක කාරණාවක් කියලා. අද ලෝකයේ පවතින ගෝලීයකරණය හරහා වාණිජයට, අලෙවියට තමයි මුල් තැන දෙන්නේ. මාධ්‍යයටත් සිදු වෙලා ඒ හරයට යන්න. ඒ ගැන ඔබ වහන්සේගේ අදහස?**

පිළිතුර : විවෘත ආර්ථිකය ඇති කළාට පසු අපේ රටේ බාහිර වශයෙන් විශාල දියුණුවක් ඇති වුණා. රැකී රක්ෂා, කර්මාන්ත විදේශ ගමන් ආදි වශයෙන් විශාල දියුණුවක් තිබෙනවා. බණ්ඩාරණායක මැතිනියගේ කාලයේ නොබැඳි සමුළුව තුළින් මැදපෙරදිග රැකියා ලැබෙන්න පටන් ගත්තා. ජේ.ආර්. ජයවර්ධන මහතා විවෘත ආර්ථිකය ඇති කළාට පස්සේ එය තවත් ඉදිරියට ගියා. එයින් විශාල හොඳකුත් සිදු වුණා. ඒ වගේම නරක දෙයකුත් වුණා. මොකද අපි අපේ රටේ කවදාවත් කතා කරපු වචන නෙමෙයි 'කුඩු', 'හෙරොයින්' වැනි දේ. ඒවා  ආවේ විවෘත ආර්ථිකය සමඟ. ඒ එක්කම මීට අවුරුදු විස්සකට විතර කලින් ආවා 'හිපියෝ' කියලා අමුතු ජාතියක්. ගම් නියම් ගම් වල ඇවිද ඇවිද ඒ අය කළේ නරක ව්‍යාප්ත කරන එක. එයින් රටට මහා විශාල විපතක් වුණා. මතක තියා ගන්න ඕනේ, කෙනෙක් වැඩෙන කොට උරහිස් දෙකම එක මට්ටමකට යන්නේ. දකුණු උරහිස මිරිච තියෙද්දී වම් උරහිස උඩට යන්නේ නැහැ. මේ උරහිස් කියන්නේ හොඳ නරක. ඒ නිසා ආගම, රජය, පොලීසිය, හමුදාව, සදාචාරාත්මක සංවිධාන තියෙන්නේ අන්න අර ඒ නරක පැත්ත නවත්වන්න. ආගමික වශයෙන් අපිට අයිති විශාල වැඩ කොටසක් තියෙනවා. තනිකර ආගමට විතරක් කරන්න බැහැ. ආරක්ෂාවත් අවශ්‍ය කරනවා. ඒ කියන්නේ රජය, පොලිසිය, හමුදාව. ඔය දෙතුන්පැත්තම එක වගේ වැඩ කළ යුතුයි. එතකොට තමයි හොඳ පැත්තෙන් ඉහළට යන්නේ. දැන් ඒ පැත්ත දුර්වල වෙලා. මුදල්, වෙළඳ බලය නිසා. විවෘත ආර්ථිකය නිසා සදාචාරාත්මක සංවිධාන පවා සියුම් අයුරින් අඩපණයි. දැන් අපි දන්නවා කලුකොඳයාවේ පඤ්ඤාසේකර මහ නායක හාමුදුරුවෝ මීට අවුරුදු හැටකට කලින් ගමක් ගමක් ගානේ වැඩියා. ඒ කාලේ ග්‍රාම සංවර්ධන සමිති, තරුණයන් වෙනුවෙන් තිබුණා ප්‍රජා මඩුළු, පාසල් වල අපරාධ මර්ධන සමිති හැම ගමකම තිබුණා. අද ඒවා දකින්න නැහැ. එදා ගමේ ඉන්න සදාචාරයට ගරු කරන ප්‍රභූ පිරිස සමාජයේ මුලිකත්වය ගත්තා. වෙන වෙනම කාන්තා, පුරුෂ හැමෝම සංවිධාන කරගෙන වැරදි මර්දනය කළා. අද ඒවා එහෙම පිටින්ම විහිළු තහළු බවට පත් වෙලා. ඒ නිසා මෙය අපි ඔක්කෝම එකතු වෙලා නිවැරදි කළ යුත්තක්. විවෘත ආර්ථිකයෙන් පැමිණි මේ සදාචාරය විනාශ කරන සැඩ පහර වලක්වා ගන්නට, අපි තනි තනිව මිසක් සංවිධානාත්මකව වැඩ පිළිවෙලක් අද දක්වා ආරම්භ කරලා නැහැ.

**ප්‍රශ්නය : අපේ ඉතිහාසය දිහා බැලුවොත්, ගමක නායකත්වය ස්වාමීන් වහන්සේලාට පන්සල හරහා දෙන්න පුළුවන් වුණා. හැබැයි විවෘත ආර්ථිකය හා**

**අලුත් පරිසරය තුළ ඒ සම්බන්ධතාවය අඩු වෙලා. ඔබ වහන්සේ කියන දේ කරන්න සමාජය තුළ පන්සලට මූලිකත්වය ලබා ගන්න අවශ්‍යයි. අපි ඒක කරන්නෙ කොහොමද?**

පිළිතුර : එදා දේවානම් පියතිස්ස රජතුමාගේ කාලයේ සිට  ගමේ ප්‍රධාන තැන පන්සලයි. දේවානම්පියතිස්ස රජ්පුරුවෝ මිහිඳු හාමුදුරුවන්ගෙන් ඇහුවා ලංකාවේ බුද්ධාගම පිහිටියා ද කියලා. මිහිඳු හාමුදුරුවෝ කිව්වේ මේ රටේ මව් පිය දෙපලක් නිසා මේ රටේ උපත ලද දරුවෙක් පැවිදිව උපසම්පදා වෙලා, පාතිමෝක්ෂාදිය ඉගෙන ගෙන ධර්ම දේශනා කරන තුරු, මේ රටේ බුද්ධාගම පිහිටියා වන්නේ නැහැ කියලා. ඒ වචනේ තියෙනවා ගැඹුරු අර්ථයක්. එය නම් මේ දායාදය ලංකාවටම දෙන්න උන් වහන්සේ යෙදුව උපායක්. ඒ ක්‍රමයට ගමක සාමාන්‍ය, වැදගත් පවුල් වල අය මහණ වුනා. ඒ ඇත්තෝ ගම ගැන දන්නවා. එනිසා ගමේ මූලිකත්වය හැමවිටකදීම පන්සලට ලැබුණා. අපි කුඩා කාලේ වුනත් පිටිසර අපේ ගම් වල ළමයෙක් උපන්නාම වෙලාව හදා ගන්න යන්නේ පන්සලට. පන්සලේ ලොකු හාමුදුරුවෝ ඒක හදලා දෙනවා. පිරිත් පැන්, තෙල් බෙහෙත්, අරිෂ්ඨ ආදිය අවශ්‍ය වේලාවට ගන්න පන්සලේ තියෙනවා. වෙද මහත්මයා හොයාගෙන ඇවිදින් ප්‍රතිකාර කරන තුරු ප්‍රථමාධාර ක්‍රමය සකස් වෙලා තිබුණේ පන්සලෙන්. සුනාමියෙන් මුහුද ගොඩ ගැලුව වේලාවේ ඔය ක්‍රමය අපට පෙනුනා. ඒ වේලාවේ මෝදර ඉදලා කතරගම, තිස්සමහාරාමය, ත්‍රිකුණාමලය දක්වා තියෙන පන්සල් ප්‍රධාන අභය භූමි වුණා. අදත් මේ පන්සල වල සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් මහජනතාව නැවතිලා ඉන්නවා. එයින් පෙනෙනවා ගමේ පන්සලට මූලිකත්වය ඉබේම ලැබෙන බව. ඒ නිසා දැන් මෙය ශක්තිමත් කරගන්න, ක්‍රමවත් බවට පත් කර ගන්න සැලසුමක් අවශ්‍යයි. එහෙම කරගත හැකි වුවහොත් රටට එය විශාල ධෛර්යයක්. ඒ නිසා පන්සල අද දක්වාම නායකත්වයේ, මූලිකත්වයේ පවතිනවා කියන එක පිළිගත යුතුයි. දැන් ඒක ක්‍රමවත් කරන්න ඔබතුමන් ඇතුළු රටේ ප්‍රභූ පිරිසත්, රජයත්, බුද්ධ ශාසන අමාත්‍යාංශයත් කටයුතු කළ යුතුව තිබෙනවා.

**ප්‍රශ්නය : සුනාමි විපත හරහා මේ ප්‍රශ්න දිහා නැවත බලන්න අවස්ථාවක් අපිට ලැබිලා තියෙනවා. ඒත් විපතක් වුනත් කෙටි කාලයකින් අමතක වෙන සිරිතක් අපේ සමාජයේ තියෙනවා. ඔබ වහන්සේට පෙනෙන විදියට මේ අවශ්‍යතාවය අපි යම් කිසි පිළිවෙලකට ඉදිරියට ගෙනියන්නෙ කොහොමද?**

පිළිතුර : එක එක සංවිධාන වලින් පොදුවේ කටයුතු කරගෙන යනවා. අමරපුර නිකායාභිවෘද්ධි මහා දායක සභාව වශයෙන් අපිත් මූලික වශයෙන් විපතට පත් පන්සල් වලට උපකාර කරන්න සැලසුමක් කතා කර ගත්තා. පහුගිය කාලේ මමත් පන්සලක් ගානේ ගියා. අපි තීරණයක් ගත්තා සෑම පන්සලකටම අත්‍යාවශ්‍ය වන,

ආරක්ෂා සහිත ධර්මශාලාවක් හදා දෙන්න. ශාලාවක් හැදුවාම දහම් පාසලකට එය ප්‍රයෝජනවත් වෙනවා. ඉඩෝරයකින්, ගංවතුර බියකින්, මුහුදු ගොඩගැලීමකින්, විපතක් වුණ වේලාවක ආරක්ෂා වෙන්න ඉඩ තියෙනවා. වෛද්‍ය සායන පවත්වන්න, සාකච්ඡාවක් වැනි උවමනාවකට අනතුරක් වැනි හදිසි අවස්ථාවකට ප්‍රයෝජනයට ගන්න ඒ වගේ දෙයක් වැදගත්.

**ප්‍රශ්නය : ධර්ම දූත සේවාව අමරපුර නිකායේ ඉතිහාසයේ කොටසක්. එයින් ජාත්‍යන්තර හා දේශීය මට්ටමෙන් වැඩ කටයුතු කරගෙන යනවා. මේ පිළිබඳව ඔබවහන්සේගේ අදහස මොකක්ද?**

පිළිතුර : යටත් විජිත ආක්‍රමණ වලින් පසු මෙරට බුද්ධ ශාසනය පිරිහුනා. පන්සල් වෙහෙර විහාරස්ථාන ඔක්කෝම පාළුවට ගියා. සියම් මහා නිකායේ උපසම්පදාව ලැබූ මහා සංඝයා වහන්සේලාට අටමස්ථානය, කතරගම, කිරිවෙහෙර, තිස්සමහාරාම ආදි වශයෙන් රට පුරා තියෙන පැරණි රජමහා වෙහෙර විහාරස්ථාන භාර ගන්න සිදු වුනා. ඊට අවුරුදු හැටකට පස්සේ අමරපුර නිකාය ආරම්භ වුනා. ඒ ඇති වෙන විට අමරපුර හාමුදුරුවන්ට පැරණි ස්ථාන නැහැ. මීට අවුරුදු හැටකට කලින් ඉඩකඩම් නින්ද ගම් සහිත පැරණි විහාරස්ථාන ටික ඔක්කෝම බෙදිලා ගිහින්. ඊළඟට අමරපුර භික්ෂූන් වහන්සේලාට උගත් කම් ඇති කර ගෙන මහජනයා පහදවා ගෙන ඔවුන්ගේ උදවු උපකාර ලබා ගෙන, ඉඩකඩම් පූජා වශයෙන් ලබා ගෙන අලුත් පන්සල් හදලා දියුණු කරන්න සිදු වුනා. අන්න ඒ නිසා ඉබේම අමරපුර නිකායික භික්ෂූන් වහන්සේලා ධර්මයෙන් මුවහත් වුණා. ඒක හිතලා කළ දෙයක් නෙමෙයි. හොඳට බණ කියනවා. එතකොට තමයි දායකයෝ පැහැදෙන්නේ. පැහැදීම ඇති කරගෙන රටට, සමාජයට වැඩ කරන්න අවශ්‍ය වුනා. එකයි හීනටියන ධම්මාලෝක මහානායක හාමුදුරුවෝ පවා කඩල, හාල්, පරිප්පු වැනි සිල්ලර බඩු අරගෙන නවසිය තිස් ගණන් වල මැලේරියා වසන්ගත කාලේ කෑගල්ල, රත්නපුර දිස්ත්‍රික්ක වල හැම තැනම ගියේ. වෙන කවුරුත් ගියේ නැහැ. හැම තැනම මැරිලා. උපකාර කරන්න ගිය ළමයි තමයි ආචාර්ය ඇන්.එම්. පෙරේරා, පිලිප් ගුණවර්ධන, රොබට් ගුණවර්ධන, ඇස්.ඒ. වික්‍රමසිංහ වගේ මහත්වරු. ඒ අය ඒ දවස් වල ආනන්ද - නාලන්ද පාසල් වල ළමයි. අන්තිමට ඒ අයත් රටේ නායකත්වයට ආවා. ඒ තත්ත්වයට ඒ අය හුරු වුණේ අමරපුර නිකායික මහා සංඝයා වහන්සේලාට පරිශ්‍රමයක් දරන්න සිදු වුන නිසා. ඊට අවුරුදු හැටකට පස්සේ 1864 දී ආරම්භ වුන රාමඤ්ඤ නිකායික මහා සංඝයා වහන්සේලාට ඊට වඩා වැඩි පරිශ්‍රමයක් දරන්න සිදු වුණා. ඒ හාමුදුරුවන්ට සිදු වුනා මේ දෙගොල්ලන්ම පෙරලාගෙන ඉදිරියට යන්න. එකෙන් ඒ හාමුදුරුවන් සිල්වත් අතින් දියුණු වුනා. මේ පසුබිම නිසයි අමරපුර නිකාය මුවහත් වුනේ. නාරද නායක හාමුදුරුවෝ, පියදස්සි නායක හාමුදුරුවෝ නොයක් රට රාජ්‍ය වලට

වැඩම කළා. නොයෙක් පොත් පත් ලිව්වා. රේරුකානේ චන්ද්‍රවිමල මහා නායක හාමුදුරුවෝ, අම්බලන්ගොඩ ධම්මකුසල මහා නායක හාමුදුරුවෝ, මොරටුවේ විදුරුපොල පියතිස්ස අනුනායක හාමුදුරුවෝ මුවහත් වුණා වැඩ කරන්න. ඒ ශක්තියෙන් උන් වහන්සේලා රටවල් ගානේ වැඩම කර ධර්ම දේශනා කළා. නේපාලය බුදුන් වහන්සේ උපන් රට. එහි තිබුණේ මහායානික බුද්ධාගම. ඒගොල්ලන් ගිහි ජීවිත ගත කරන අය ලාමාවරු. සීතල නිසා ලාකඩ පාට ගෝනි වගේ රෙදි භික්ෂූන් පොරවන්නේ. 1934 දී තමයි තරුණ නාරද හමුදුරුවෝ බණ කියන්නේ නේපාලයට වැඩියේ. ඉන්දියාවට ගිහිල්ලා බොහෝ දුක සේ තමයි ගියේ. හැම තැනම කඳු ශිඛර නිසා දෝලාවක තියලා උස්සගෙන වැඩම කළ නාරද හාමුදුරුවෝ එක්ක ගිය තරුණ ළමයි දෙදෙනා තමයි මහාචාර්ය ඇන්.බී. ආරියපාල මැතිතුමා හා මහාචාර්ය රත්නසූරිය මැතිතුමා.

පසුව එහෙන් ළමයි ගෙනැවිත් වජිරාරාමයේ මහණ කරලා විද්‍යාලංකාර, විද්‍යෝදය ආදි පිරිවෙන් වල උගන්වලා ථෙරවාදි බුදු දහම ඒ රට වල ඇති කළා. අමරපුර නිකායික ධර්ම දූත කටයුතු මුවහත් වෙන්න හේතු වුනේ එවැනි කාරණා. අදත් උන්වහන්සේලා වටිනා සේවයක් අනික් දෙනිකායත් එක්ක එකතු වෙලා කරනවා.

**ප්‍රශ්නය ඃ ඔබ වහන්සේට පෙනන ආකාරයට අද ජාත්‍යන්තර පරිසරය තුළ පවතින තාක්‍ෂණ යුගය හරහා බුද්ධ ධර්මයට අලුත් අවස්ථාවක් තිබෙනවා. එක එක ආකාරයට බටහිර ලෝකයත් ධර්මය දෙස බලනනවා. එම නිසා ධර්ම දූත ක්‍රියාවලියකට අද හොඳ අවස්ථාවක් තියෙනවා නේද ?**

පිළිතුර ඃ අද බොහෝම හොඳ අවස්ථාවක් තියෙනවා. අපේ රටේ කවුරුත් දන්න දෙයක්, බෞද්ධයන් අබෞද්ධයන් කරනවා කියලා මහා ඝෝෂාවක් තියෙනවා. බටහිර රටවලත් ඔය ආකාරයෙන්ම තියෙනවා. අපේ ගම් වලට ඇතැම් අය හා සංවිධාන ගිහින් ආහාර පාන, කෑම බීම දීලා අයුතු විදියට අපේ අය හරවා ගන්නවා කියලා කතාවක් තියෙනවා. ඒ අපේ දුප්පත් කමින් ගන්න ප්‍රයෝජන. නමුත් අපි ඒ පැත්ත බලනකොට බටහිර ලෝකයටත් ඊට වඩා බරපතල තත්ත්වයක් තියෙනවා. මොකද හේතුව? දැන් අලුතින් ඉගෙන ගෙන හැදී ගෙන එන බටහිර ලෝකයේ තරුණ සමාජය දැන් පල්ලියට යන්නේ නැහැ. අද කවුරුත් දන්න ප්‍රකට කාරණය, පල්ලි විකුණනවා කියන එක. බෞද්ධයෝ, මුස්ලිම්වරු පන්සල් හා අනෙකුත් කටයුතු සඳහා මේවා මිලදී ගන්නවා. ඒ නිසා පරම්පරා ගතව ක්‍රිස්තියානි, කතෝලික ආගම අදහපු පවුල් වල වැඩි හිටියන්ට විශාල වේදනාවක් තියෙනවා. ''දැන් අපේ ළමයි පල්ලියට යන්නේ නැහැ. ආගම අදහන්නේ නැහැ'' කියලා. ඉතින් අපි ඒ ළමයි එක්ක කතා කළොත් ගත් කටටම බොහෝම ආඩම්බරයෙන් කියන්නේ ණිැ ිරු ත්‍රැ එයසබනැරිය. කියලයි. අපි

නිදහස් මතධාරීන්. නූතන විද්‍යාව ඉගෙන ගෙන ඒ ගොල්ලන් ඔය පැරණි ක්‍රම පිළිගන්නේ නැහැ. නමුත් බුදු දහමේ තියෙන දාර්ශනික පැත්ත පිළිගන්නවා. බුද්ධාගමේ දක්වලා තියෙන දාර්ශනික කරුණු, විද්‍යාත්මක කරුණු පිළිගන්නවා. බුදු හාමුදුරුවෝ දේශනා කළා ''මේ වගේ ග්‍රහලෝක ඕන තරම් තියෙනවා. තව මනුෂ්‍ය ලෝක වල තව මනුෂ්‍යයෝ ඉන්නවා. සම්බන්ධීකරණය තමයි අමාරු'' කියලා. ඉතින් ඒක අදත් පිළිගෙන තියෙනවා.

බුදුහාමුදුරුවන්ගේ කාලයේ තාරකා ශාස්ත්‍රය උගත් බ්‍රාහ්මණයෙන් මහණ වුනා. නිරන්තරයෙන් බුදුන් වහන්සේගෙන් ලෝකේ තියෙන්නේ කොහේද? ලෝකේ ඇති වුනේ කොහොමද? නැති වෙන්නේ කොහොමද? කියලා අහනවා. නමුත් බුදුහාමුදුරුවෝ උත්තර දෙන්නේ නැහැ. දවසක් එතුමා කේන්තියෙන් වගේ ඇවිල්ලා ''ඔබ වහන්සේ මං මේ අහන වැදගත් ප්‍රශ්න වලට පිළිතුරු දුන්නේ නැති නම් මම සිවුරු හැරලා යනවා'' කියලා කියනවා. එදා බුදුහාමුදුරුවෝ කතා කළා. ඔබ මහණ වෙන්න කලින් මගෙන් පෙරොන්දුවක් ගත්තා ද මම මහණ වුණාට පස්සේ මෙන්න මේ මේ වගේ ප්‍රශ්න අහනවා. මේ පිළිබඳව මට කරුණු කියා දෙන්න ඕනේ කියලා, එහෙම පොරොන්දුවක් මගෙන් ගත්තා ද? ''නැහැ'' කියලා පිළිතුරක් ලැබුණා.

ඔබ ලෝකය පිළිගත්ත, දඹදිව ඉතාමත් ප්‍රසිද්ධ විද්‍යාඥයෙක්. මම කිව්වාද ඔබේ විද්‍යාත්මක ප්‍රශ්න වලට පිළිතුරු දෙන්නම් මහණ වෙන්න කියලා. ''නැහැ''. එහෙමනම් ඔබ කතා කරන දේ තේරුම මොකක්ද? මම ඔබට උපමාවක් කියන්නම්. මිනිහෙකුට ඊතළ පහරක් වැදුණා. ඒ මිනිහා ඊතළ පහර කාගෙන් වැටෙනවා. ඉන්න අයට තියෙන්නේ මොකක්ද? ඉතාමත් ඉක්මනින් මැදිහත් වෙලා ප්‍රවේශමෙන් අවශ්‍ය උපකාර කරලා අර ඊතළය ගලවා ඔහු සුවපත් කිරීම. ඒ වේලාවට කවුද විද්දේ? කොච්චර දුර ඉඳලාද විදලා තියෙන්නේ? මේක මලකඩ තියෙන එකක්ද? මේක විෂ තියෙන එකක්ද? මොකක්ද විදින්න තියෙන හේතුව? ඒවා අහන්න වේලාවක් නෙමෙයි. ඒ වේලාවේ අර පුද්ගලයා බේරා ගන්න කළ යුතු ප්‍රතිකාර ටික කරන්න අවශ්‍යයි. අන්න ඒ වගේ මේ ලෝකය දුකක්. ඒ දුකින් නිදහස් වෙන මාර්ගයක් කියා දෙන්නයි මම බුදු බවට පත් වුනේ. මම මේ අනවශ්‍ය ප්‍රශ්න එක්ක වැඩ කරන්න ගියොත් මට සිද්ධ වෙන්නේ ඒ ප්‍රශ්න වලට උත්තර දෙන්න. මං මේ පාරමිතා පුරාගෙන අදහස් කර ගත්ත අදහස මුදුන්පත් කර ගන්න බැරි වෙනවා'' කියලා බුදුහාමුදුරුවෝ දේශනා කළා.

මේ ලෝකයේ පෙනෙන්නේ අහස. මේ වාගේ ග්‍රහලෝක තව දහස් ගණන්, ලක්ෂ ගණන් තියෙනවා. අද විද්‍යාවෙන් එය ඔප්පු කරනවා. අන්න ඒ නිසයි බටහිර ලෝකයේ තරුණ පිරිස අනෙක් පැත්තට හැරුනේ. ඒ රටවලත් ඔය ප්‍රශ්නය

තියෙනවා. ඒ නිසා බුදු දහම ගෙනයන්න දාර්ශනික මට්ටමින් ඉතාමත්ම හොඳ කාලපරිච්ජේදයකයි දැන් අපි ඉන්නේ. කළ යුතු දේ අපේ දැන උගත් තරුණ භික්ෂූන් වහන්සේලා පිරිසක් හදා ගැනීමයි.

**ප්‍රශ්නය : ස්වාමින්වහන්ස, ඒක කරන්නේ කොහොමද? ඒ අභියෝගයට මුහුණ දෙන්නේ කොහොමද?**

පිළිතුර : අපිට මුල ඉඳලා වැරදුනා. ඒ සඳහා මගේ හා අපි වැඩි දෙනෙකුගේ පිළිගැනීම වන්නේ භික්ෂූන් වහන්සේලාට දැනුම, ඥාණය ලබා දීම අත්‍යාවශ්‍ය බවයි. දැන් බලන්න අපේ ස්වාමින් වහන්සේලා සිංහල, සංස්කෘත, පාලි දන්නවා. දැන් ඒවාත් අඩු වෙලා. ඉංග්‍රීසි, අපේ රටේම සහෝදර භාෂාවක් වන ද්‍රවිඩ. අපේ ආසන්න රටේ භාෂාව වන හින්දි, ජපන්, ජර්මන්, ප්‍රංශ ආදි භාෂාවන් ඇතුළුව දෙක තුනක් ඉගෙන ගන්න පුරුදු කරනවා නම් උන් වහන්සේලාට ඕනෑම රටක නවාතැන් අරගෙන ධර්මය දේශනා කරන්න පුළුවන්. අපේ සරසවි දෙක තුනක් හැදුවා. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, විද්දෝද්‍ය විශ්ව විද්‍යාලය. ඔය හැම එකකින්ම කළේ රජයේ පාසල් වලට ගුරුවරුන් සකස් කිරීම. 1957 සිට පාසැල් වල උගන්වන්න උපාධිධාරි ස්වාමින්වහන්සේලා බිහි වෙනවා. දැන් තරුණ භික්ෂූන්වහන්සේ නමක් හමුවෙලා ඇහුවොත් මොනවාද දන්නේ කියලා මම බෞද්ධ සංස්කෘතිය, සිංහල භාෂාව, නැත්නම් බුද්ධාගම නැත්නම් තව මොකක් හරි කියයි. නමුත් භාෂා දැනීමක් නැහැ. විශ්ව විද්‍යාලයකින් සමත් වු දක්ෂ ශිෂ්‍යයෙක් මැදවච්චියෙන් එහාට ගිය ගමන් ගොළු වෙයි. උතුරේ මිනිසුන් එක්ක දෙමළ වචන හතරක් කතා කරන්න දන්නේ නැහැ.

**ප්‍රශ්නය : ස්වාමින්වහන්ස, අපි සාකච්ඡාව පටන් ගත්තේ අපේ අපරාධ රැල්ල, අපේ සමාජයේ තියෙන ප්‍රශ්න ගැන කතා කරලා. අවසාන වශයෙන් ඔබ වහන්සේට එක උපදෙසක් තියෙනවා නම් අපේ පාලකයන්ට, දේශපාලනඥයන්ට, සමාජ නායකයන්ට දෙන්න ඒ උපදෙස කුමක්ද?**

පිළිතුර : හොඳට මතක තියා ගන්න බුද්ධ ධර්මය හොඳට දන්නවා නම් අපිට කාගෙන්වත් උපදෙස් අහන්න අවශ්‍ය වෙන්නේ නැහැ. බුදුහාමුදුරුවෝ මේ හැම ප්‍රශ්නයකටම උත්තර දී තියෙනවා. සමාජයක් සකස් කර ගන්න අවශ්‍ය පළමුවැනි දේ තමයි. සදාචාරය. හැදිච්චකම. ඒකට තමයි පංචශීලය ඉදිරිපත් කළේ. සමාජයක් සදාචාරවත් වු විට ගෙදරත්, පවුලෙත්, රටේත්, පාර්ලිමේන්තුවෙත් කලකෝලහල, හැල හැප්පිලි කිසිවක් නැහැ. ඒ නිසා සදාචාරය ඇති කර ගන්න අවශ්‍යයි. සදාචාරය හදා ගත් විගස ඇති වෙනවා සාමය. ඒකට අමුතු මහන්සියක් අවශ්‍ය නැහැ. ගෙදර දොරේ කතා බස් කිරීම මගින් ගමේ රටේ හැම තැනකම එකමුතු

කම ඇති වෙනවා. පුද්ගලයන් අන් අයගේ අදහස් ගරු කරන තත්ත්වයට පත් වෙනවා. අද ඒක නැහැ. ඊළඟට එයින් ඉබේම ඇති වන ප්‍රතිඵලය තමයි සෞභාග්‍යය. ඒ සඳහා සුදුසු වැඩපිළිවෙලක් යොදා ගන්න කියලා මම සැම දෙනාගෙන්ම ඉල්ලීමක් කරන්න කැමතියි.

**බොහෝම ස්තුතියි ස්වාමින් වහන්ස.**